# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2024 ජනවාරි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

සමස්ත ප්‍රශ්න පත්‍රය තුළ පළමු අදියරේ ව්‍යාපාර පරිසරය විෂයයට අදාළ සියලු අංශයන් ආවරණය වී ඇති අතර, මෙහි අරමුණ වූයේ විෂය පිළිබඳ සමස්ත දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීමයි. සමස්තයක් වශයෙන් ගත්කල බොහෝ විභාග අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල සතුටුදායක වන අතර අනෙක් අය හොඳින් පිළිතුරු දීමට අපොහොසත් වී ඇත. අයදුම්කරුවන් පිළිතුරු ලබා දී ඇති ආකාරය නිරීක්ෂණය කිරීමේදී, ප්‍රමාණවත් ලකුණු ලබා ගැනීම සඳහා පහත කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කළ යුතු බව අවබෝධ වී ඇත.

## A කොටස

### ප්‍රශ්න අංක 01

මෙම කොටස මගින් ව්‍යාපාර පරිසරය විෂයෙහි සමස්ත ක්ෂේත්‍ර ආවරණය කර ඇති අතර සියලුම අයදුම්කරුවන් පාහේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා උත්සාහ කර ඇත. මුළු ලකුණු 100 න් 40 ක් මෙම ප්‍රශ්නය සඳහා වෙන් කර තිබූ අතර අයදුම්කරුවන්ගෙන් 90% ක් ලකුණු 30 කට වඩා ලබාගෙන තිබුණි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් **1.3, 1.8, 1.17** සහ **1.20** ප්‍රශ්න සඳහා සාර්ථකව පිළිතුරු සපයා නොතිබූ අතර, එම ප්‍රශ්න සම්බන්ධ නිරීක්ෂණ පහත පරිදි වේ:

**1.3** අයදුම්කරුවන්ගෙන් බහුතරයක් 'මුදල් වෙළඳපොළ' පිළිබඳව නිසි ලෙස දැනුවත්ව නොසිටි අතර බහුතරයක් වැරදි පිළිතුර තෝරාගෙන තිබුණි. නමුත් සාමාන්‍ය සිසුන් සංඛ්‍යාවක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**1.8** බොහොමයක් අයදුම්කරුවන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ වැදගත්කම හඳුනාගෙන නොතිබුණි. ඔවුන් නිවැරදි පිළිතුර වෙනුවට පිළිතුරු අංක 4 තෝරාගෙන තිබුණි.

**1.17** බොහෝ අයදුම්කරුවන් රක්ෂණයේ "උපරිම විශ්වාසය මූලධර්මය" පිළිබඳ අවබොධයක් නොතිබුණු අතර එමනිසා ඔවුන් දෙපාර්ශවයම විස්තර කිරීම වෙනුවට රක්ෂණකරු / රක්ෂකයා පමණක් විස්තර කර ඇත. බොහෝ අපේක්ෂකයින් ප්‍රශ්නයට නිසි පිළිතුරු ලබා දී නැත.

**1.20** බොහෝ අපේක්ෂකයින් "කොළඹ කොටස් හුවමාරුවේ කාර්යයන්" හඳුනාගෙන නොතිබුණි. කොළඹ කොටස් හුවමාරුව වෙනුවට බහුතරයක් විවිධ වර්ගයේ වෙළඳපොලවල් විස්තර කර ඇත. ණය පහසුකම් ලබා ගැනීම සහ කොටස් නිකුත් කිරීම කොළඹ කොටස් හුවමාරුවේ කාර්යයන් ලෙස ඇතැමුන් විස්තර කර තිබුණි.

කෙසේ වෙතත්, ඉහත ප්‍රශ්න හැර, බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට හොඳින් පිළිතුරු දී ඇත.

**සමස්ත කාර්යසාධනය සතුටුදායක තත්වයේ පවතී.**

## B කොටස

මෙම කොටස අනිවාර්ය ප්‍රශ්න 4 කින් සමන්විත වන අතර සෑම ප්‍රශ්නයකටම ලකුණු 10 බැගින් ලබාදී ඇත.

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය "හවුල් ව්‍යාපාර" මාතෘකාව මත පදනම් වී ඇත.

**(a)** මෙම කොටසින් හවුල් ව්‍යාපාරයක ලක්ෂණ පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. සමහර අපේක්ෂකයන් පැහැදිලි කිරීමකින් තොරව ලක්ෂණ පමණක් සඳහන් කර තිබුණි. එබැවින් ඔවුන් විසින් වෙන් කර ඇති සම්පූර්ණ ලකුණු ලබාගෙන නොමැත. කෙසේ වෙතත්, අයදුම්කරුවන් බහුතරයක් මෙම කොටස සාර්ථකව පැහැදිලි කර සම්පූර්ණ ලකුණු ලබා ගෙන ඇත.

**(b)** මෙම කොටසින් හවුල් ව්‍යාපාරයක අවාසි පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර වෙනුවට හවුල් ව්‍යාපාරයක අවාසියක් ලෙස ලාභ බෙදාගැනීම ලියා ඇති අතර එම නිසා ඔවුන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමේ අවස්ථාව මග හැරී ඇත.

**(c)** බොහොමයක් අයදුම්කරුවන් හවුල්කරුවෙකුගේ යුතුකම් හඳුනාගෙන සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. එහෙත්, ඉතා සුළු අපේක්ෂකයින් පිරිසක් හවුල්කරුවෙකුගේ යුතුකමක් ලෙස "ප්‍රාග්ධනයට දායක වීම" ලියා ඇත.

අයදුම්කරුවන් බහුතරයක් මෙම ප්‍රශ්නයට ඉතා හොඳ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය මගින් ප්‍රවාහනය පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීම අපේක්ෂා කර ඇත.

**(a)** මෙම කොටස මගින් අපනයනකරුවෙකුට ආහාර ප්‍රවාහනයේ ඇති වාසි පැහැදිලි කිරීම බලාපොරොත්තු වේ. අයදුම්කරුවන් බහුතරයක් මෙම කොටසට නිසි පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි. නමුත් අයදුම්කරුවන් කිහිප දෙනෙකු කරුණු පමණක් සඳහන් කර ලකුණු කිහිපයක් අහිමි කරගෙන ඇත.

**(b)** අයදුම්කරුවන් බහුතරයක් තම සාමාන්‍ය දැනුම භාවිතා කරමින් නව තාක්ෂණයේ වාසි ලියා ලකුණු ලබා ගෙන තිබුණි.

**(c)** මෙම කොටසෙන් විදේශ වෙළඳාමේදී භාවිතා කරන ලියකියවිලි පැහැදිලි කිරීම අපේක්ෂා කර ඇත. බොහොමයක් අපේක්ෂකයින් විදේශ වෙළඳාමේදී භාවිතා කරන ලියකියවිලි හඳුනාගෙන නොතිබූ අතර ඔවුන් වෙළඳාමට අදාළ ලියකියවිලි පැහැදිලි කර ඇත. උදා. චෙක්පත්, මිලදී ගැනීම/විකිණීම ඉන්වොයිසි, විදේශ ගමන් බලපත්‍ර ආදිය.

නිවැරදි පිළිතුරු වනුයේ නාම මාත්‍ර ඉන්වොයිසිය, වාණිජ ඉන්වොයිසිය, ප්‍රභවස්ථාන සහතිකය, නෞභාරපත, රක්ෂණ සහතිකය, හානිරක්ෂණ ලිපිය සහ සනීපාරක්ෂක සහතිකය යනාදියයි.

එබැවින් ඔවුන්ට සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට නොහැකි වූ අතර බහුතරයක් ලබාගෙන තිබුණේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයක් පමණි.

## ප්‍රශ්න අංක 04

**(a)** අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය ප්‍රමාණයක් **XYZ සමාගමෙහි** සේවකයන් සඳහා අදාල වන රක්ෂණ ඔප්පුවට අදාළව පිළිතුරු ලියා නොතිබුණි. සමහර අපේක්ෂකයින් කර්මාන්තශාලා සේවකයින් සඳහා රක්ෂණ ඔප්පුව වෙනුවට ගිනි රක්ෂණය සහ සොරබිය රක්ෂණය විස්තර කර ඇත.

**(b)** අපේක්ෂකයින්ගෙන් බහුතරයක් "රක්ෂ්‍ය හිමිකම" යන යෙදුම හඳුනාගෙන නොතිබූ අතර රක්ෂ්‍ය හිමිකම නීතිමය බැඳීමක් පමණක් ලෙස පැහැදිලි කර ඇත. නමුත් අපේක්ෂකයින් සුළු ප්‍රමාණයක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** මෙම කොටසින් රක්ෂණය අවදානමක් ලෙස පිළිගැනීමට භාවිත කරන නිර්ණායක පරීක්ෂා කරන ලද අතර, අවදානමක් ලෙස රක්ෂණය සඳහා වන නිර්ණායක පැහැදිලි කිරීමට අසමත් වීම හේතුවෙන් අපේක්ෂකයින් බහුතරයක් නිවැරදි පිළිතුර ලියා නොතිබුණි. නිවැරදි පිළිතුරු වනුයේ පුරෝකථනය කළ හැකි බව, අවදානම් සම්බන්ධතා වලින් තොර වීම සහ සත්‍යාපනය කළ හැකි වීමයි.

එබැවින් අයදුම්කරුවන්ගෙන් බහුතරයක් ලබාගෙන තිබුණේ ඉතා අඩු ලකුණු ප්‍රමාණයකි.

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මගින් අන්තර්ජාල බැංකුකරණ පහසුකම සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කිරීමට අපේක්ෂා කර ඇත.

**(a)** මෙම කොටස මගින් හොඳ මුදලක ලක්ෂණ පිළිබඳ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය සංඛ්‍යාවක් හොඳ මුදලක ලක්ෂණ වෙනුවට හොඳ මුදලක කාර්යයන් සඳහන් කර තිබුණි. එම නිසා ඔවුන් වෙන් කළ ලකුණුවලින් අඩක් පමණක් ලබාගෙන තිබුණි.

**(b) (i)** මෙම කොටස විද්‍යුත් මුදල් මත පදනම් වී ඇත. ණයපත් ප්‍රශ්නයේම සඳහන් කර තිබුණද අයදුම්කරුවන්ගෙන් බහුතරයක් පිළිතුරෙහි ණයපත් ලියා තිබුණි. විද්‍යුත් මුදල් පසුම්බිය, ණයපත්, ස්මාර්ට් කාඩ්පත්, Macro Chips සහ පෙරගෙවුම් කාඩ්පත් උදාහරණ කිහිපයක් වේ.

**(ii)** අන්තර්ජාල බැංකුකරණය පිළිබඳ ප්‍රායෝගික දැනුම තුළින් අයදුම්කරුවන් බහුතරයක් සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. මෙම කොටසින් අන්තර්ජාල බැංකු පහසුකම් භාවිතයෙන් ලබාගත හැකි සේවාවන් පරීක්ෂා කරන ලදී. නමුත් අන්තර්ජාල බැංකුකරණයේ වාසි ගැන සඳහන් කර තිබුණේ අයදුම්කරුවන්ගෙන් සුළු ප්‍රමාණයකි.

**(c)** මෙම කොටසින් චෙක්පතක මූලිකාංග සඳහන් කිරීම අපේක්ෂාකර ඇති අතර අයදුම්කරුවන් බහුතරයක් මෙම කොටසට සාර්ථකව පිළිතුරු දී සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

<u>**C කොටස**</u>

## ප්‍රශ්න අංක 06

මෙය **සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගම** සම්බන්ධ සිද්ධි අධ්‍යයනය පදනම් කරගත් ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සැපයීමට උත්සාහ කර ඇති අතර ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් සාමාන්‍ය මට්ටමේ ලකුණු ලබාගෙන ඇත.

**(a)** මෙම කොටසින් සමාගමක් ලෙස භුක්ති විඳිය හැකි වාසි පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් බහුතරයක් නිවැරදිව පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. නමුත් සමහර අයදුම්කරුවන් හවුල් ව්‍යාපරයක වාසි ගැන සඳහන් කර ඇත.

**(b)** මෙම ප්‍රශ්නය මගින් PESTEL විශ්ලේෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමට අපේක්ෂා කර ඇත. අයදුම්කරුවන්ගෙන් අඩක් PESTEL විශ්ලේෂණය තේරුම් ගෙන නොතිබූ අතර ඔවුන් ඒ වෙනුවට SWOT විශ්ලේෂණය විස්තර කර ඇත. සමහර අපේක්ෂකයින් සාර්ව පාරිසරික බලවේගයන් සඳහන් කර ඇති නමුත් එක් එක් බලවේග සඳහා සාධක සඳහන් කර නොමැත. තවද, අයදුම්කරුවන් කිහිප දෙනෙකු මෙම කොටසට උත්තර ලිවීමට උත්සාහ කර නොතිබුණි.

**(c)** මෙම ප්‍රශ්නය මගින් සංවිධානයක් විසින් එහි ඇල්මැති පාර්ශවයන්ට ඇති වගකීම් සපුරාලිය යුත්තේ ඇයිද යන්න පිළිබඳව අවබෝධය පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බහුතරයක් නිසි පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. කෙසේ වෙතත් සමහර අපේක්ෂකයින් අභ්‍යන්තර සහ බාහිර පාර්ශවයන් ඇල්මැති පාර්ශවයන් ලෙස ලියා තිබුණි.

**(d)** මෙම කොටසින් රජය විසින් ව්‍යාපාරවලට බලපෑම් කරන ආකාරය පරීක්ෂා කර ඇත. බොහොමයක් අයදුම්කරුවන් සාමාන්‍ය දැනුම භාවිතයෙන් ව්‍යාපාර සඳහා රජයේ බලපෑම් පිළිබඳ මෙම ප්‍රශ්නයට පහසුවෙන් පිළිතුරු ලබා දී සම්පූර්ණ ලකුණු ලබා ගෙන තිබුණි.

**(e)** මෙම ප්‍රශ්නය මගින් සීමාසහිත සිරි මෝටර් හවුස් (පෞද්ගලික) සමාගමේ ව්‍යාපාර සාර්ථකත්වයට "නිර්මාණශීලීත්වය" කෙසේ උපකාර වන්නේද යන්න පරීක්ෂා කර ඇත. අපේක්ෂකයින්ගෙන් බහුතරයක් "නිර්මාණශීලිත්වය" පිළිබඳව ලියා ඇතත් එය ලබා දී ඇති සිද්ධියට සම්බන්ධ කළ යුතු බව නොසළකා හැර ඇත. අයදුම්කරුවන් සුළු ප්‍රමාණයක් සාර්ථකව පිළිතුර ලියා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

ප්‍රශ්නයට පිළිතුරු ලිවීමට පෙර සිද්ධිය හොඳින් කියවා තේරුම් ගැනීම සිදුකළ යුතු වේ.

\- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබිම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒඒටි ආයතනය මඟින් නිකුත් කරන ස්ව-අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටගෙන විභාගයට මුහුණ දීය යුතුය.

- * * * -